*සැ. යු.* - 2020.08.21 වැනි දින අංක 2,190 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,191 - 2020 අගෝස්තු මස 28 වැනි සිකුරාදා - 2020.08.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 146 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 149 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 සැප්තැම්බර් මස 18 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පී. ජී. සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.09.04 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/4189 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, දකුණු ඉවුර, යාය 10 පදිංචි පහලගේ රොමානිස් වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1078 යටතේ 1998.02.06 දින 289/153 පිටුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකුවීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.09.21 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

අනුරාධපුර, පරිපාලන දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු විලච්චිය පත්තුවේ/කෝරළයේ 452 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ යාය 10 නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 02 (දෙකයි) රූඩ් 02 (දෙකයි) පර්චස් 00ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : (ගොඩ)

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 23 පාර රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | පියදස ජයලත්ගේ ඉඩම (280න් කොටසක්), |
| *දකුණට* | : | බෙදුම් ඇල රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | අංක 281 1/2 (ආර්. කේ. ගුණවතීගේ ඉඩම), අංක 282 1/2 (එස්. එච්. දයාවතීගේ ඉඩම). |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2020 ජනවාරි මස 27 වැනි දින.

08-678/1

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) පී. ජී. සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අති ගරු ජනාධිපති විසින් 2000.11.20 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/5275 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය දකුණු ඉවුර, යාය 11 පදිංචි කඩවත කංකානම්ගේ ගුණරත්න වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 125 යටතේ 2009.02.20 දින 700/32 පිටුවෙහි ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.09.21 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

අනුරාධපුර,දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු විලච්චිය පත්තුවේ/කෝරළයේ රාජාංග නය ජනපදය 453 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රාජාංගනය යාය 11 නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. සි. අ. 16 දරන කට්ටි කැබීමේ පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 00 රූඩ් 02 පර්චස් 00 ක් ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : (ගොඩ)

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 558 පාර හා පාර රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | රූපරත්නගේ ගොඩ ඉඩම, |
| *දකුණට* | : | ධර්මසේනගේ ගොඩ ඉඩම, |
| *බස්නාහිරට* | : | චන්ද්‍රසේනගේ ගොඩ ඉඩම. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2020 මාර්තු මස 06 වැනි දින.

08-678/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංග නය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) පී. ජී. සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1992.01.27 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/116 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන රාජංගනය දකුණු ඉවුර, යාය 05 පදිංචි වීරප්පුලිගේ පීටර් ප්‍රනාන්දු වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3043 යටතේ පිටු අංක 346/82 හි 1999.07.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.09.21 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ එප්පාවල කෝරළයේ 447 ග්‍රාම සේවා නිළධාරි කොට්ඨාසයේ රණ්දෙනිගම නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 03 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 429 දරන පිඹුරෙහි අංක 237 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර එකක් රූඩ් තුනක් පර්චස් දාහතක් ඇති ගණන් බලා තිබෙන මඩ ඉඩම යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ ද රජයේ ඉඩම් කට්ටිය :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 255න් දක්වෙන කුණුඇල රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | අංක 238 මඩ ඉඩමේ කැබැල්ල, |
| *දකුණට* | : | අංක 249 කෙත් ඇල රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | අංක 236න් දක්වෙන මඩ ඉඩම් කැබැල්ල. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2020 පෙබරවාරි මස 03 වැනි දින.

08-678/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංග නය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) පී. ජී. සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.08.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/931 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජංග නය යාය 11 පදිංචි වැලිවිටගේ ප්‍රේමදාස වෙත ප්‍රදානය කොට අනුරාධපුරය දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3196 යටතේ 1995.11.08 දින 65/196 පිටුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.09.21 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

### උපලේඛනය

අනුරාධපුර, පරිපාලන දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ නුවරගම් පළාත පත්තුවේ/කෝරළයේ 453 ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ යාය 11 නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ජ. සි. අ. 16 දරන පිඹුරෙහි අංක 369 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 02, පර්චස් 00ක් ඇතැයි ගණන් බලා තිබෙන ගොඩ ඉඩම යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | අංක 368 ගොඩ ඉඩම, |
| *දකුණට* | : | අංක 392 හා අංක 253 ඉඩම, |
| *බස්නාහිරට* | : | අංක 370 ගොඩ ඉඩම. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2020 ජනවාරි මස 13 වැනි දින.

08-678/4

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/59804.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/LS/Tri/kuc/80.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවෙලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සෙන්තූරි නිලධාරි වසමේ සෙන්තූර් ගමේ PLC/EP/28/SUR/01/2016/27 පිඹුරේ කැබලි අංක ඒ වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 08 ක් කෘෂිකාර්මික කටයුතු සඳහා සේනානායක අප්පුහාමිලාගේ දොන් ආනන්ද විසින් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : ප්‍රධාන පාර සහ මාර්ගය,
*නැගෙනහිරට* : ප්‍රධාන පාර,
*දකුණට* : රජයේ ඉඩම,
*බටහිරට* : කැබලි අංක බී.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* :- අවුරුදු තිහයි (30) (2020.02.04 දින සිට ඉදිරියට),

*වාර්ෂික බදු මුදල* :- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

වාර මුදල. - වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වගා කටයුත්තක් සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2020.02.04 දින සිට වසර (05) පහක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්.එල්. ඒ. සංජීව,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 ජූලි මස 28 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'' රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-625

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/22087(XVI)
මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී/එල්සී/එල්ඩී/4/1/4/634.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 691 - කුණ්ඩසාලේ උතුර ග්‍රාම නිලධාරි වසමේ කුණ්ඩසාලේ ගමේ මු. පි. මහ 5253 පිඹුරේ කැබලි අංක 12න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0521ක් වූ රජයේ ඉඩම් කොටස

බමුනේන්ද්‍ර මුදියන්සේලාගේ පොල්වතුරේ ගෙදර පාලිත විජය බණ්ඩාර මහතා විසින් නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 11 සහ මු. පි. මහ 5162 හි කැබලි අංක 08, |
| *නැගෙනහිරට* | : | මු. පි. මහ 5162 හි කැබලි අංක 08, |
| *දකුණට* | : | කැබලි අංක 19, |
| *බටහිරට* | : | කැබලි අංක 13. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* :- අවුරුදු 30 යි, (2020.06.17 දින සිට වසර තිහක් ඉදිරියට),

*වාර්ෂික බදු මුදල* :- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1994 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි.

වාර මුදල. - වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම් නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාද ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.06.17 දින සිට වසර (05) පහක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් පැවරීම් හා අතුරු බදු දීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩී. එම්. යූ. පී. කේ. උඩගෙදර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 අගෝස්තු මස 28 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැඳුර'' රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-677